සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. මානවයාගේ මොළය හා ස්නායු පද්ධතිය දියුණු වීම නිසා සිදු වූ වැදගත් ම වෙනස වන්නේ,

(1) ශරීරාංග පාලනය කිරීමයි. (2) බුද්ධිය ලැබීමයි.

(3) අත්දැකීම් හා හැඟීම් හුවමාරුවයි. (4) ගුහා බිත්තිවල රූප ඇඳීමයි.

02. ක්‍රි.පූ. 01 වන සියවසේ දී චීනය විසින් මුල් ම කඩදාසිය නිර්මාණය කරනු ලැබීය. එහි ගෞරවය හිමිවන්නේ,

(1) ට්සායි ලුංට ය. (2) ජොහැනස් ගුටෙන්බර්ග්ට ය.

(3) සැමුවෙල් මෝස්ට ය. (4) හැරල්ඩ් ඩී. ලැස්වෙල්ට ය.

03. ලැස්වෙල්ගේ අර්ථකථනයත්, ෂැනොන් වීවර්ගේ ගණිතමය සූත්‍රයත් අධ්‍යයනය කිරීම මඟින් පෙනී යන ප්‍රධානතම කරුණ වන්නේ,

(1) සන්නිවේදකයා ග්‍රාහකයාගේ සමාජ තත්ත්වය අවබෝධ කරගන්නා බවයි.

(2) සන්නිවේදක හා ග්‍රාහක භූමිකා හුවමාරු වන බවයි.

(3) ග්‍රාහකයා විසින් මනා ලෙස සන්දේශය සකස් කළ යුතු බවයි.

(4) මෙම සන්නිවේදන ක්‍රියාවලීන් දෙකම එක් අතකට පමණක් ගමන් කරන බවයි.

04. සන්නිවේදන වර්ග අතරින් ආදී කාලීන ජනයා විසින් කිසිසේත් ම අපේක්ෂා නොකළ තාක්ෂණික දියුණුව නිසා බිහි වූ සන්නිවේදන වර්ගය වන්නේ,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනය (2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

(3) සමූහ සන්නිවේදනය (4) ජන සන්නිවේදනය

05. ජනමාධ්‍ය ආයතනයක හිමිකම ග්‍රාහකයා කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) මාධ්‍ය ආයතනවල අභිමතය වන්නේ උපරිම වශයෙන් සිය මාධ්‍ය වටා ග්‍රාහකයන් ගොනු කර ගැනීමයි.

(2) ව්‍යාපාරික අනුග්‍රාහකයින්ගෙන් හෝ දායකත්වයෙන් තොරව ජන මාධ්‍ය සිය කටයුතු කරයි.

(3) සමාජ යහපත උදෙසා ග්‍රාහකයින් වෙත විශාල බලපෑමක් ඇති කිරීමට ජනමාධ්‍යයට හැකිය.

(4) ජන සමාජයේ ශුභ සිද්ධිය සඳහා අවශ්‍ය ආකල්ප, දැනුම හා කුසලතා වර්ධනයට මාධ්‍ය ක්‍රියාකළ යුතුය.

06. විද්‍යුත් තැපෑලේ ඇති විශේෂත්වය වන්නේ,

(1) ඉතා ඉක්මනින් මැකී යාමයි.

(2) ඉතා ඉක්මනින් පිළිතුරු යැවිය නොහැකි වීමයි.

(3) දෘශ්‍යමාන නොවන තොරතුරු අනාවරණය වීමයි.

(4) යවන්නාට හා ලබන්නාට ඉතා ඉක්මන් සන්දේශ හුවමාරුවයි.

07. වර්තමානය වන විට අන්තර්ජාලයේ ජනප්‍රියම සෙවුම් යන්ත්‍ර වන්නේ,

(1) Linkedin හා Yahoo ය. (2) Facebook හා twitter ය.

(3) Yahoo හා Google ය. (4) Facebook හා Linkedin ය.

08. විනිවිදක පත්‍ර හා විනිවිදක රූප රාමු පිළිවෙළින් යොදා ගන්නා ප්‍රක්ෂේපණ යන්ත්‍ර වන්නේ,
(1) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය හා කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය
(2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය හා බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය
(3) අන්තර් ක්‍රියාකාරී පුවරුව හා ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය
(4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය හා කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය

09. පාසලක විදුහල්පති කාර්යාලය සුවිශේෂී වේ. එහි ඇති මේසය, පුටුව, කාමරයේ විශාලත්වය යන සාධක අවාචිකව යමක් ප්‍රකාශ කරයි. මෙම අවස්ථාව අවාචික සන්නිවේදනයේ,
(1) සාමාජීය සාධකයකි. (2) පාරිසරික සාධකයකි.
(3) ශාරීරික සාධකයකි. (4) පොදු සාධකයකි.

10. පරිකල්පනය ඉතා ප්‍රබල ලෙස භාවිත වන ජනමාධ්‍ය වර්ගය වන්නේ,
(1) පුවත්පත (2) ගුවන්විදුලිය (3) රූපවාහිනිය (4) අන්තර්ජාලය

11. ග්‍රාහකයා විසින් තමාට අවශ්‍ය වූ තොරතුරු යම් යම් ආකාර වලින් ග්‍රහණය කරගනු ලබයි. එම ආකාර හඳුන්වන්නේ,
(1) සන්නිවේදන වර්ග (2) සන්නිවේදන ස්වරූප (3) සන්නිවේදන ප්‍රතිචාර (4) සන්නිවේදන බාධක

12. ආරම්භකයා විසින් තමා තෝරාගත් කිහිප දෙනෙකුට සන්දේශ ලබා දෙන අතර ඔවුන් විසින් තෝරාගත් කිහිප දෙනෙකුට පමණක් සන්දේශ ලබාදීමේ ක්‍රියාවලිය,
(1) පර්ෂද දාමය (2) තනි දාමය (3) ඕපාදූප දාමය (4) සම්භාවිතා දාමය

13. බස් රථයක සීනුව නාද කිරීමේ දී සිදුවන සන්නිවේදන ස්වරූපය නම්,
(1) වාචික සන්නිවේදනයයි. (2) ලිඛිත සන්නිවේදනයයි.
(3) ශ්‍රව්‍ය සන්නිවේදනයයි. (4) දෘශ්‍ය සන්නිවේදනයයි.

14. මාධ්‍ය දින තරගාවලියේ සහතික පත්‍ර ලැබූ හර්ෂි එය වඩා සුරක්ෂිත දිගු කාලයක් පුරා තබා ගැනීම සම්බන්ධව ගත යුතු වඩාත් නිවැරදි තීරණය වන්නේ,
(1) ඡායාරූප ගත කිරීම. (2) ලැමිනේටින් කිරීම.
(3) ඡායාපිටපත් ලබා ගැනීම. (4) කවරයක බහා තැබීම.

15. අවාචික සන්නිවේදනයේ ශාරීරික සාධකයක් නොවන්නේ,
(1) නිවසින් ඉදිරිපිට කොහොඹ අතු එල්ලීම. (2) ඇඳුම් පැළඳුම්
(3) ඇස්වල හැසිරීම (4) මුහුණේ ඉඟි හා ඉරියව්

16. පුද්ගලයා සමාජයට හුරුකරවීමත්, එම ගති සිරිත් පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යාමත් හැඳින්වෙන්නේ,
(1) සංවාද හා සාකච්ඡා ලෙසය.
(2) ඒකාබද්ධතාව හා ප්‍රගමනය ලෙසය.
(3) විනෝදාස්වාදය හා සංස්කෘතිය පවරා දීම ලෙසය.
(4) සමාජානුයෝජනය හා සංස්කෘතික ප්‍රගමනය ලෙසය.

17. මධ්‍යම රාත්‍රී 12 සිට ඉන්ධන මිල ඉහළ යන බව දැනගත් කපිල සිය තෝරාගත් හිත මිතුරන් කිහිප දෙනෙකුට පමණක් කියා සිටියේය. මේ තුළින් දැකිය හැක්කේ,
(1) තනි දාමය (2) ඕපාදූප දාමය (3) සම්භාවිතා දාමය (4) පර්ෂද දාමය

18. බොහෝ දුරට සිදුවන්නේ ඒක පාර්ශවීය සන්නිවේදනයකි. එනම් සන්නිවේදකයාගෙන් ග්‍රාහකයාට තොරතුරු ගලායාමයි. සන්නිවේදනය සිදුවන ආකාරය අනුව ග්‍රාහක ප්‍රතිචාර හිමිවේ. මෙම ක්‍රියාවලිය සිදුවන්නේ,
(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය තුළය. (2) සමූහ සන්නිවේදනය තුළය.
(3) ජන සන්නිවේදනය තුළය. (4) පුද්ගලාන්තර සන්නිවේදනය තුළය.

19. රූපවාහිනියේ ප්‍රචාරය වන වෙළඳ දැන්වීම් වලින් ප්‍රේක්ෂකයාට සිදුවන බලපෑමක් නොවන්නේ,
(1) සිරිත් විරිත්, ආචාරධර්ම පිරිහීම. (2) කෘත්‍රිම ආහාර මිලදී ගැනීමට පෙළඹවීම.
(3) සාම්ප්‍රදායික ජන ජීවිතයට ඇලුම් කිරීම. (4) අනවශ්‍ය පරිභෝජන රටාවන්ට හුරු වීම.

20. කථිකයෙකු විසින් යොදාගනු ලබන යෙදුම්, භාෂාප්‍රයෝග, වචන, පර්යාය වචන, අලංකාර භාවිත කිරීමෙන් භාෂාව රසවත් කරන්නේ,
(1) අර්ථ ගැන්වීමටය. (2) උච්චාරණය සඳහාය. (3) යෝග්‍යතාවය සඳහාය. (4) කථනය සඳහාය.

21. විධිමත් සන්නිවේදනය හා සන්නිවේදන ප්‍රභේදය විස්තර වන පිළිතුර වන්නේ,
   (1) නවීන ශ්‍රව්‍ය මාධ්‍ය භාවිතා කළ යුතුය.
   (2) යම් සංවිධානයක ජීව රුධිරය වන්නේ විධිමත් සන්නිවේදනයයි.
   (3) කිසියම් නිශ්චිත අරමුණක් ඉටුකරගැනීම සඳහා පුද්ගලයන් එකතු වීමයි.
   (4) සංවිධානයක ප්‍රධානියාත් බලයට යටත්ව සැලසුම් සහගතව ක්‍රියාත්මක නොවෙයි.

22. ජනමාධ්‍යයන්ගේ ස්වභාවයක් නොවන්නේ මින් කුමන කරුණ ද?
   (1) සන්දේශය පොදු වීම.
   (2) මූලික වශයෙන් ඒකමාර්ගිකව සිදු වීම.
   (3) තාක්ෂණික වශයෙන් උපකරණ භාවිත නොවීම.
   (4) සංවිධිත ආයතනගත ස්වභාවයක් ගැනීම.

23. විධිමත් සන්නිවේදනයේ දී එක් අයෙකුගෙන් තවත් අයෙකුට ද එයින් තවත් අයෙකුට ද වශයෙන් පණිවිඩය ගලා ගොස් අවසානයේ සන්නිවේදකයා වෙතම සන්දේශය නැවත සම්බන්ධ වන්නේ,
   (1) දාම ආකෘතියෙනි. (2) වයි ආකෘතියෙනි. (3) රෝද ආකෘතියෙනි. (4) චක්‍ර ආකෘතියෙනි.

24. 1981 දී දවස පුවත්පත් සමාගම හෙවත් ස්වාධීන පුවත්පත් සමාගම පිහිටුවන ලද්දේය. එහි අයිතිකරු බවට පත්වූයේ,
   (1) එච්.එස්. පෙරේරා මහතාය. (2) ජී.වී. පැලිස් අප්පුහාමි මහතාය.
   (3) උපාලි විජේවර්ධන මහතාය. (4) පූජ්‍ය බුලත්ගම ධම්මාලංකාර හිමිය.

25. ශ්‍රී ලංකාවේ ප්‍රථම රූපවාහිනී සේවාව බවට හිමිකාරීත්වය ලබා ගන්නේ,
   (1) ස්වාධීන රූපවාහිනී සේවය (2) ලක්හඬ රූපවාහිනී සේවය
   (3) TNL රූපවාහිනී සේවය (4) ජාතික රූපවාහිනී සේවය

26. මාණ්ඩලික වාර්තාකරුවන් හා පුවත්පත් වාර්තාකරුවන් විසින් සපයන තොරතුරු ප්‍රවෘත්තියකට අවශ්‍ය පරිදි සකස් කරනු ලබන්නේ,
   (1) ප්‍රධාන කර්තෘ ය. (2) මාණ්ඩලික වාර්තාකරු ය.
   (3) ප්‍රවෘත්ති සංස්කාරක ය. (4) උප කර්තෘ ය.

27. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් පුවත්පත් මාධ්‍යවේදීන් සඳහා වූ ආචාර ධර්ම පද්ධතියක් ප්‍රකාශයට පත් කරන ලද්දේ,
   (1) රජයේ ඍජු මැදහත් වීමෙනි.
   (2) මාධ්‍ය අකාර්යක්ෂමතා දුරු කිරීමේ ක්‍රමයක් ලෙසිනි.
   (3) රජයේ වක්‍ර මැදිහත් වීමෙනි.
   (4) රජය පිළිබඳ හිතකර මතයක් නිර්මාණය කිරීමටය.

28. ජනමාධ්‍ය මගින් කෙරෙන සාමාජීය බලපෑමට අදාළ කරුණකි,
   (1) පරිභෝජන රටාව වෙනස් කිරීමක් සිදු නොවේ.
   (2) ජීවන ගැටලුවලට යෝග්‍ය මෙන්ම අයෝග්‍ය තීරණ ගැනීමට අවස්ථා නැතිවීම.
   (3) විවිධ පරමාර්ථ පුද්ගලයින් තුළ ගොඩනැංවීමට නොහැකි වීම.
   (4) විවිධ චර්යා ඇති කිරීමට පුද්ගලයා පෙළඹවීම.

29. රජයේ මාධ්‍යයන්ගේ ප්‍රධානතම කාර්යය වන්නේ,
   (1) රජය පිළිබඳ යහපත් හා හිතකර ජනමතයක් නිර්මාණය කිරීම.
   (2) ප්‍රවෘත්ති සඳහා ගුවන්කාලය, පුවත්පත්වල ඉඩ වෙන් කිරීම.
   (3) රජයේ දේශපාලන මතවාද පිළිගන්නා ග්‍රාහක කොට්ඨාසයක් නිර්මාණය කිරීම.
   (4) ව්‍යාපාරික අනුග්‍රහයෙන් හෝ දායකත්වයෙන් තොරව මාධ්‍ය ක්‍රියාකිරීම.

30. ඉතාලි ජාතික ගුග්ලි එල්මෝ මාර්කෝනි විසින් ගුවන් විදුලි සමාගම අරඹන ලද්දේ,
   (1) 1897 - එංගලන්තයේ දී ය. (2) 1860 - යුරෝපයේ දී ය. (3) 1922 - ශ්‍රී ලංකාවේ දී ය. (4) 1863 - චීනයේ දී ය.

31. වැඩි දියුණු කළ පසු බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් භාවිත කර එය අදාළ සුවිශේෂී මෘදුකාංගය පරිගණකයේ ස්ථාපනය කර ලබාගත හැක්කේ,

(1) අන්තර්ජාලය යි. (2) පේජරය යි.
(3) අන්තර් ක්‍රියාකාරී පුවරුව යි. (4) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.

32. සන්නිවේදන ක්‍රියාවලියේ දී දොරටුපාල ගේ කාර්යය වන්නේ,

(1) සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා වෙත යන සන්දේශය පාලනය කිරීම යි.
(2) සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර යහපත් සන්නිවේදන අවස්ථාවක් ඇති කිරීම යි.
(3) සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා වෙත සන්දේශය බාධාවකින් තොරව ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම යි.
(4) සන්නිවේදකයා විසින් ග්‍රාහකයා වෙත යවන සන්දේශය විකෘති වීම වැළැක්වීම යි.

33. සන්නිවේදනය ද්වි මාර්ගික ක්‍රියාවලියකි. මෙයින් අදහස් වන්නේ,

(1) සන්නිවේදනයේ දී ග්‍රාහකයෙකු සිටිය යුතු බව යි.
(2) ප්‍රතිපෝෂණයක් සිදුවනැති බව යි.
(3) සන්නිවේදක ග්‍රාහක භූමිකා හුවමාරු වන බව යි.
(4) ඝෝෂා අවම මට්ටමක ඇති බව යි.

34. විධිමත් සන්නිවේදනය හා අවිධිමත් සන්නිවේදනය සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වෙයි.

A - විධිමත් සන්නිවේදනය හා අවිධිමත් සන්නිවේදනය සම්බන්ධව ප්‍රකාශ කිරීමට හැක්කේ එය සමාජ අවශ්‍යතාවයක් බවයි.
B - අවිධිමත් සන්නිවේදනය නිසා සමාජයට හිතකර මෙන්ම අහිතකර බලපෑම් ද සිදුවිය හැකිය.
C - විධිමත් සන්නිවේදනයේ දී සන්නිවේදකයා දක්ෂ විය යුතු අතර විධිමත් සන්නිවේදනයේ දී ග්‍රාහකයා බුද්ධිමත් විය යුතුය.

ඉහත ප්‍රකාශ තුළින් සත්‍ය වන්නේ.

(1) A හා B පමණි. (2) A හා C පමණි.
(3) B හා C පමණි. (4) A, B හා C යන සියල්ල සත්‍ය වෙයි.

35. සාමාන්‍ය පෙළ දේශනයකට දේශකයෙකුට වගු, ප්‍රස්තාර ආදිය පෙන්වීමේ අවශ්‍යතාව මතුවිය. ඒ සඳහා ඔහු යොදාගත යුතු වන්නේ,

(1) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය (2) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය
(3) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය (4) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය

36. නිල ලිපි ශීර්ෂයක් සහිතව ලිපියක් ඒ අයුරින් ම ඉක්මනින්, පහසුවෙන් වෙනත් ස්ථානයකට දීමට යොදා ගත යුතු සුදුසු ම ක්‍රමය,

(1) විද්‍යුත් තැපෑල යි. (2) ෆැක්ස් යන්ත්‍රය යි. (3) ඩිජිටල් කැමරාව යි. (4) ඡායා පිටපත් යන්ත්‍රය යි.

37. ලිපි තැපැල් කිරීම මහා පරිමාණයෙන් කිරීමේ දී මුද්දර ඇලවීම අපහසුය. එසේ ම අනාරක්ෂිත මෙම අපහසුතා මග හරවා ගැනීමට භාවිතා කළ යුතු වන්නේ,

(1) මුදල් ගණන යන්ත්‍රය (2) තැපැල් මුද්‍රණ යන්ත්‍රය (3) දින මුද්‍රා යන්ත්‍රය (4) ගණක යන්ත්‍රය

38. ශ්‍රව්‍ය මාධ්‍ය නිපුණතා අප ජීවිතයේ විවිධ අවස්ථාවල දී ප්‍රයෝජනවත් වෙයි. විවිධ අවස්ථා වලදී පහත ශබ්ද අතරින් සාම්ප්‍රදායික ශබ්ද මාධ්‍යයක් නොවන්නේ,

(1) බෙරහඬ (2) වයලීනයක නාදය (3) හූව (4) සුළඟේ ශබ්දය

39. ජනමාධ්‍යයන්ගේ අහිතකර බලපෑම්වලට දරුවන් වැඩිපුර ගොදුරු වන්නේ,

A - ඔවුන් ජනමාධ්‍යයේ උපක්‍රමශීලී පෙළඹවීම්වලට හසුවන නිසාය.
B - ජනමාධ්‍ය වඩාත් ආකර්ෂණීය නිසාය.
C - ඔවුන් විචාරශීලී බවින් තොර නිසාය.
D - දරුවන් භාණ්ඩ හා සේවාවල ඉල්ලුම්කරුවන් වන නිසාය.

ඉහත ප්‍රකාශ තුළින්,

(1) A පමණක් නිවැරදිය. (2) B, D පමණක් නිවැරදිය.
(3) A, D පමණක් නිවැරදිය. (4) A, B, C හා D යන සියල්ල ම නිවැරදිය.

40. මාධ්‍ය බාධක ඇතිවීමට හේතුවකි,

(1) ග්‍රාහක දැනුමේ දුර්වලතා නිසා පණිවිඩය අවබෝධ කරගත නොහැකි වීම.
(2) ග්‍රාහකයාගේ ආකල්ප වලට අනුව පණිවිඩය තේරුම් ගැනීමට අපහසු වීම.
(3) තාක්ෂණික සන්නිවේදන ක්‍රියාවලියක ස්වභාවය මෙම ආකෘතියේ දැක්වෙයි.
(4) මෙම ආකෘතිය මූලික අංග පහකින් සමන්විත වේ.

(ල. 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II** | කාලය පැය 02 යි

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකය:

වැදගත් :

- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) මාදළුව ''සිරිපුර ගාමිණී මහා විද්‍යාලයේ උදෑසන රැස්වීමේදී විදුහල්පතිතුමා පෙර දින පැවති ක්‍රීඩා උත්සවයේ සියලු කටයුතු වෙනුවෙන් කැපවී වැඩකළ සියලුම අංශ වලට ස්තුති කළේය.

(i) ක්‍රීඩා උත්සවකින් ඉටු කර ගත හැකි සන්නිවේදන අරමුණු දෙකක් සඳහන් කරන්න.

(ii) මෙම රැස්වීම කුමන සන්නිවේදන වර්ගයට අයිති ද?

(iii) ක්‍රීඩා උත්සවය පිළිබඳව සකස් කළ ආරාධනා පත්‍රයක් යැවිය හැකි ක්‍රමයක් නම් කරන්න.

(iv) මෙම ක්‍රීඩා උත්සවයේ තොරතුරු රූපවාහිනියේ ප්‍රවෘත්ති ප්‍රකාශයෙන් විකාශය විය. එහිදී පණිවිඩය පැහැදිලිව නොකියූ බව ප්‍රේක්ෂකයන්ගේ අදහස විය. මෙය සන්නිවේදනයේ කවර අවස්ථාවක් ද?

(v) මෙම ක්‍රීඩා උත්සවය විධිමත් සන්නිවේදන අවස්ථාවක් ලෙස තහවුරු කළ හැකි සාධක දෙකක් දක්වන්න.

(vi) ක්‍රීඩා උත්සවය වෙනුවෙන් කැපවූ පුද්ගලයින් හා ආයතන පිළිබඳව විදුහල්පතිතුමා කෘතඥතා පූර්වකව සිහි කළේ ය. ඔවුනට ස්තුති කළ හැකි ක්‍රම 02 ක් දක්වන්න.

(vii) විදුහල්පතිතුමා මෙම අවස්ථාවේ වාචික සන්නිවේදනය භාවිත කරයි. වාචික සන්නිවේදන නිපුණතා සංවර්ධනයට ගත යුතු ක්‍රියා මාර්ග දෙකක් සඳහන් කරන්න.

(viii) මෙම සන්නිවේදන අවස්ථාවේ සන්නිවේදකයා හා සමූහය අතර සම්බන්ධය ගොඩනැංවීමට බලපාන ක්‍රමවේද දෙකක් සඳහන් කරන්න.

(ix) සන්නිවේදකයාට දේශනය අවස්ථාවේ භාවිතා කළහැකි අවාචික සන්නිවේදන විධික්‍රම දෙකක් ලියන්න.

(x) ක්‍රීඩා උත්සවයේදී ජයග්‍රාහකයින්ට පිරිනැමූ සහතික පත්‍රය පිළිබඳව සිසුන් කීප දෙනෙකු සාකච්ඡා කරන අතර අමල් හා බිමල් ඒ පිළිබඳ රහස් කතාබහක යෙදුණි. එය අන්තර් පුද්ගල සන්නිවේදනයේ කුමන අවස්ථාවක් ද?

(ලකුණු 2 x 10 = 20)

(02) දදුරු ඔය කලාප යෝජනා ක්‍රමයේ ගොවි මහතුන්ගේ රැස්වීමක් පසුගියදා පවත්වන ලදී.

(i) මෙම රැස්වීම පිළිබඳව අජිත් කේන්ද්‍ර කරගෙන බොහෝ දෙනෙකුට පණිවිඩය දැනුම් දෙන ලදී. එය කුමන සන්නිවේදන අවස්ථාවක් ද? (ල. 01)

(ii) මෙම රැස්වීමේ වාර්තාවක් ලියන ලදී. ලේඛනය යනු කුමක්දැයි අර්ථ දක්වන්න. (ල. 02)

(iii) වාචික සන්නිවේදනයට වඩා ලිඛිත සන්නිවේදනය විධිමත් වන ආකාර තුනක් විස්තර කරන්න. (ල. 03)

(iv) මෙම රැස්වීමේදී ගොවි මහතුන් මෙම තොරතුරු පොතක් ලෙස නිකුත් කර ලබාදීම ඉතා සුදුසු බව යෝජනා කරන ලදී. අකුරු යෝජනය හා පිටු සැලසුම සඳහා යොදාගන්නා ජනප්‍රිය මෘදුකාංග හතර විස්තර කරන්න. (ල. 04)

(03) නාලිකා උදෙන්ම අවදි වී භාවනා කොට, ගුවන් විදුලියට සවන් දුන්නාය. ආච්චි අම්මාට තේ කෝප්පයක් සාදා දුන්නේ සීනි ඇතිදැයි අසමින් ය.

(i) ඉහත සිදුවීම තුළ ඇති සන්නිවේදන වර්ග නම් කරන්න. (ල. 01)

(ii) දුරකථන භාවිතයේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් 02 ක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(iii) සමූහ සන්නිවේදනය තුළ ප්‍රදීපාගාර උපක්‍රමය භාවිතා වන ආකාරය විස්තර කර දක්වන්න. (ල. 03)

(iv) ජනසන්නිවේදනයේ මූලික ලක්ෂණ හතරක් විස්තර කරන්න. (ල. 04)

(04) මානවයා විසින් තම කටහඬ මගින් යම් යම් අදහසක් ප්‍රකාශ කරන්නට දැරූ උත්සාහය නිසා කථන භාෂාවක් බිහිවිය.

(i) ආදි මානව සන්නිවේදනය පිළිබඳව තොරතුරු ලබා ගත හැකි ලෝ ප්‍රකට පැරණිම ගුහා චිත්‍ර දෙක නම් කරන්න. (ල. 01)

(ii) සාම්ප්‍රදායික හා නූතන දෘශ්‍ය මාධ්‍ය 02 බැගින් හඳුන්වන්න. (ල. 02)

(iii) පුද්ගලයකුගේ සන්නිවේදන කාර්යය ආරම්භ වන්නේ කුමන සන්නිවේදන වර්ගයකින් ද? එහි විශේෂතා හතරක් දක්වන්න. (ල. 03)

(iv) ඵලදායී ලේඛනයක ලක්ෂණ හතරක් විස්තර කරන්න. (ල. 04)

(05) ගුග්ලිමෝ මාකෝනි විසින් 1897 දී ගුවන් විදුලි සංඥා සමාගම එංගලන්තයේ ආරම්භ කරන ලදී.

(i) ලංකාවේ ප්‍රථම නිල ගුවන් විදුලි ප්‍රචාරය සිදු කළේ කවදා ද? (ල. 01)

(ii) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හිමිකමේ රාජ්‍ය දායකත්වය කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(iii) ආයතනයකට සම්බන්ධ මාධ්‍ය ශ්‍රමිකයන් විස්තර කරන්න. (ල. 03)

(iv) අවාචික සන්නිවේදනයේ සාධක වර්ග තුන නම් කොට විස්තර කරන්න. (ල. 04)

(06) සන්නිවේදනය පිළිබඳ විවිධ විද්වතුන් විසින් නිර්වචන ඉදිරිපත් කොට ඇත.

(i) සන්නිවේදනය පිළිබඳ ගණිතමය සූත්‍රය ඉදිරිපත් කළ විද්වතුන් දෙදෙනා නම් කරන්න. (ල. 01)

(ii) සන්නිවේදනයේ මූලික කාර්යයන් දෙකක් විස්තර කරන්න. (ල. 02)

(iii) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ ප්‍රයෝජන තුනක් විස්තර කරන්න. (ල. 03)

(iv) වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ වාසි හතරක් උදාහරණ ඇසුරෙන් දක්වන්න. (ල. 04)

(07) පන්ති කාමරයේදී ප්‍රියජනක ඉගෙනුම් මෙවලමක් සඳහා විවිධ උපකරණ භාවිත වේ.

(i) වෙබ් අඩවියක් යන්න හඳුන්වන්න. (ල. 01)

(ii) පුවත්පතක දැන්වීම් අංශය හඳුන්වා දෙන්න. (ල. 02)

(iii) ඕනෑම රජයක තිබිය හැකි ප්‍රධාන රාජ්‍ය අරමුණු හතර කෙටියෙන් දක්වන්න. (ල. 03)

(iv) මාධ්‍ය ක්‍රියාකාරීත්වය කෙරෙහි රජයේ ඍජු බලපෑම් හතරක් විස්තර කරන්න. (ල. 04)